Nestlé Lanka PLC News Release

Colombo: 24 November 2016

# නෙස්ලේ ලංකා සමාගම 2016 ස්වර්ණදීප රන් සම්මානය හිමි කරගනී

**ශ්‍රී ලංකාව කිරිවලින් ස්වයංපෝෂිත කිරීමේ දැක්ම යථාර්තයක් කරගැනීම සඳහා ලබා දෙන දායකත්වය ඇගයීමට ලක් කෙරේ.**

නෙස්ලේ ලංකා සමාගම දේශීය කිරි කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් නිරන්තරවම තම කැපවීම ලබා දෙයි. ශ්‍රී ලංකාව කිරිවලින් ස්වයංපෝෂිත කිරීමේ රජයේ දැක්ම යථාර්තයක් කරවීම සඳහා ලබාදෙන සහයෝගය අගයමින් 2016 ස්වර්ණදීප රන් සම්මානය හිමි කරගැනීමට නෙස්ලේ ලංකා සමාගම සමත් විය.

දේශීය කිරි කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් නෙස්ලේ ලංකා සමාගම ඉටුකරන ක්‍රියාශීලී කාර්යභාරය පිළිගැනීමට ලක්කරනු ලබන සංකේතයක් ලෙස 2016 ස්වර්ණදීප සම්මානය හැඳින්වීම වඩාත් නිවැරදිය. නෙස්ලේ ලංකා සමාගම ශ්‍රී ලංකාවේ පුද්ගලික ක්ෂේත්‍රයේ දැවැන්තම නැවුම් කිරි මිලදී ගන්නා වේ. එලෙස දේශීය කිරි ගොවීන්ගෙන් මිලදී ගන්නා නැවුම් කිරි යොදාගනිමින් නෙස්ලේ ලංකා සමාගම සිය නෙස්ප්‍රේ, මයිලෝ සහ මිල්ක්මේඩ් වැනි නිෂ්පාදන සිදු කරයි. 2015 වර්ෂයේදී නෙස්ලේ ලංකා සමාගම 20,000කට ආසන්න දේශීය කිරි ගොවීන් ප්‍රමාණයකගෙන් මිලදී ගත් නැවුම් කිරි වෙනුවෙන් ආයෝජනය කළ මුදලෙහි වටිනාකම රුපියල් බිලියන 3.6ක් වේ. පසුගිය වර්ෂ කිහිපය තුළ නෙස්ලේ ලංකා සමාගම කිරි එකතු කිරීමේ සහ කිරි ශීත කිරීමේ මධ්‍යස්ථාන කිහිපයක්ම විවෘත කරන ලදී. එහි නවතම පියවර වූයේ උතුරු පළාතේ උරුම්පිරෙයි නගරයේ විවෘත කළ කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයයි. උරුම්පිරෙයි අවට කිරි ගොවි ජනතාවගේ ජීවිත සවිබල ගැන්වීම සඳහා එයින් ලැබෙනුයේ විශාල සහයෝගයකි.

"ශ්‍රී ලංකාවේ දේශීය නැවුම් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට සහ ශ්‍රී ලංකාව කිරි වලින් ස්වයංපෝෂිත කරවීමේ දැක්ම යථාර්තයක් කරවීම සඳහා අප ගනු ලබන උත්සාහයන් මේ සම්මානය හරහා ඇගයීමට ලක්වීම විශාල ගෞරවයක් ලෙස අපි සලකනවා. දේශීයව නිෂ්පාදනය කරගන්නා නැවුම් කිරි අපගේ නිපැයුම් සඳහා යොදා ගනිමින් අපි ඉදිරියටත් මෙරට කිරි කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් කැපවෙනවා. මෙය, රටේ ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රබලව දායක වෙනවා." යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා ශිවානි හෙග්ඩේ මහත්මිය ස්වර්ණදීප සම්මානය හිමිවීම පිළිබඳව සිය අදහස් දක්වා සිටියාය.

නිදහස් ලංකා ජන සන්නිවේදකයින්ගේ සංගමය විසින් සංවිධානය කරනු ලබන ස්වර්ණදීප සම්මාන උළෙල පැවැත්වීමේ අරමුණ වන්නේ රටේ යහපැවැත්ම වෙනුවෙන් කැපවීම් සිදු කළ පුද්ගල චරිත මෙන්ම ආයතන ඇගයීමයි.